ඔබ දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක්ද?

ඔබ,

දේශීය වශයෙන් හෝ විදේශීය රාජ්‍යයක් විසින් හෝ ජාත්‍යන්තර සංවිධානයක් විසින් ප්‍රමුඛ රාජ්‍ය කර්තව්‍ය පවරා ඇති යම් පුද්ගලයකු, එනම්,

- ✦ යම් රාජ්‍යයක හෝ රජයක ප්‍රධානියකු,
- ✦ දේශපාලන කටයුතු වල නිරත පුද්ගලයකු,
- ✦ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධරයකු,
- ✦ අධිකරණ ක්ෂේත්‍රයේ ඉහළ නිලධරයකු,
- ✦ යුධ, නාවික, ගුවන් හමුදා හා පොලිසියේ ඉහළ නිලධරයකු,
- ✦ රජය සතු සංස්ථාවක, රජයේ හෝ ස්වාධීන ආයතනයක ජ්‍යෙෂ්ඨ විධායක නිලධරයකු (මධ්‍යම මට්ටමේ හෝ කනිෂ්ඨ මට්ටමේ නොවන) හෝ
- ✦ ඉහත සඳහන් කළ තැනැත්තකු ගේ සමීප පවුලේ සාමාජිකයකු හෝ ආශ්‍රිතයකු,

වේ නම්, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් විසින් ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ දී, ඔබ දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ.

ඔබ ඉහතින් දැක්වූ පුද්ගලයකු වන්නේ නම්, ඒ බව පහත දක්වා ඇති මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සමග ගනුදෙනු සිදු කිරීමේදී දැනුම් දිය යුතු වේ.

මූල්‍ය ආයතන

උදා:

- ◆ බලපත්‍රලාභී බැංකු
- ◆ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්
- ◆ කොටස් තැරැව්කාර සමාගම්
- ◆ මුදල් හෝ වටිනාකම් පැවරීම් සේවා සපයන්නන්
- ◆ රක්ෂණ සමාගම්
- ◆ පරිසීමිත වෙළෙඳුන්

නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්

උදා:

- ◆ කැසිනෝ
- ◆ නිශ්චල දේපළ අනුයෝජිතයන්
- ◆ මැණික් හා ස්වර්ණාභරණ අලෙවිකරුවන්
- ◆ ගණකාධිකාරීවරුන්, නීතිඥවරුන්, නොතාරිස්වරුන් සහ වෙනත් ස්වාධීන නීති වෘත්තිකයන්
- ◆ භාර සහ සමාගම් සේවා සපයන්නන්

මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් විසින් තම ගනුදෙනුකරුවන් සමග ගනුදෙනු සිදු කරන විට පාරිභෝගිකයා හෝ ප්‍රතිලාභී හිමිකරු දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තෙක් ද යන්න තීරණය කිරීම සඳහා යෝග්‍ය අභ්‍යන්තර ප්‍රතිපත්ති, කාර්ය පටිපාටි සහ පාලන ක්‍රම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

මෙය 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2016 අංක 01 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති සහ 2018 අංක 01 දරන නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති යටතේ ඇති අවශ්‍යතාවයකි.

එබැවින්, මේ සඳහා සියලුම මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්හි ගනුදෙනුකරුවන්ගේ සහයෝගය අපේක්ෂා කෙරේ.

දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් පිළිබඳ වැඩි විස්තර සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද "2019 අංක 03 දරන දේශපාලන වශයෙන් අනාවරණය වූ තැනැත්තන් හඳුනාගැනීම සඳහා වූ මාර්ගෝපදේශ" වෙත යොමු වීමට QR කේතය ස්කෑන් කරන්න.

ඔබට වැඩිදුර විස්තර අවශ්‍ය නම්, මූල්‍ය බුද්ධි ඒකකය අමතන්න.

මූල්‍ය බුද්ධි ඒකකය

நிதியியல் உளவறிதல் பிரிவு

FINANCIAL INTELLIGENCE UNIT

☎ 0112 477 125 | 0112 477 692 | fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk

நீங்கள் அரசியல்ரீதியாக முகங்கொடுக்கும் ஆளொருவரா?

நீங்கள்,

உள்நாட்டிலோ அல்லது வெளிநாடொன்றின் மூலமாகவோ முக்கிய பகிரங்க தொழிற்பாடுகள் பொறுப்பளிக்கப்பட்டுள்ள அல்லது பன்னாட்டு அமைப்பொன்றில் உள்ள ஆளொருவராயின், அதாவது,

- ✦ அரசு அல்லது அரசாங்கமொன்றின் தலைவராயின்.
- ✦ அரசியல்வாதியொருவராயின்.
- ✦ மூத்த அரசாங்க அலுவலரொருவராயின்.
- ✦ நீதித் துறை அலுவலரொருவராயின்.
- ✦ இராணுவ அதிகாரியொருவராயின்.
- ✦ அரசிற்குச் சொந்தமான கூட்டுத்தாபனத்தின்/அரசாங்கத்தின் அல்லது சுயதீர்ணயம் கொண்ட நிறுவனத்தின் மூத்த நிறைவேற்றலுவலரொருவராயின் (நடுத்தர பதவிவகிப்போரை அல்லது கனிஷ்ட பதவிவகிப்போரை உள்ளடக்காது) அல்லது,
- ✦ மேற்குறித்தவர்களின் நெருங்கிய குடும்ப அங்கத்தவர்களாயின் அல்லது கூட்டாளிகளாயின்.

நிதியியல் நிறுவனங்கள் அத்துடன் பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபாரங்கள் மற்றும் தொழில்கள் மூலம் வாடிக்கையாளர் உரிய விழிப்புக் கவனத்தை நடாத்துகின்ற போது, நீங்கள் அரசியல்ரீதியாக முகங்கொடுக்கும் ஆளொருவராக வகைப்படுத்தப்படுவீர்கள்.

மேற்குறிப்பிட்ட வரைவிலக்கணத்தின் கீழ் நீங்கள் உள்ளடங்குவீர்களாயின், நிதியியல் நிறுவனங்களுடன் மற்றும் பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபாரங்கள் மற்றும் தொழில்களுடன் கொடுக்கல்வாங்கலொன்றை மேற்கொள்ளும் போது அரசியல் ரீதியாக முகங்கொடுக்கின்ற ஆளொருவராக உங்களது அந்தஸ்தை தெரியப்படுத்துவதற்கு நீங்கள் வேண்டப்படுகின்றீர்கள்.

நிதியியல் நிறுவனங்கள்

உதாரணம்:

- ◆ உரிமம்பெற்ற வங்கிகள்
- ◆ உரிமம்பெற்ற நிதிக் கம்பனிகள்
- ◆ பங்குத்தொகுதி தரகுக் கம்பனிகள்
- ◆ பணம் அல்லது பெறுமதி மாற்றல் பணி வழங்குநர்கள்
- ◆ காப்புறுதிக் கம்பனிகள்
- ◆ மட்டுப்படுத்தப்பட்ட வணிகர்கள்

பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபாரம் மற்றும் தொழில்கள்

உதாரணம்:

- ◆ கசினோக்கள்
- ◆ உண்மைச் சொத்து முகவர்கள்
- ◆ இரத்தினக்கற்கள் மற்றும் ஆபரண வணிகர்கள்
- ◆ கணக்காளர்கள், சட்டத்தரணிகள், நொத்தாரிசுகள் மற்றும் வேறு சுயாதீன சட்ட தொழில்சார் நிபுணர்கள்
- ◆ நம்பிக்கைப்பொறுப்பு மற்றும் கம்பனி பணி வழங்குநர்கள்

நிதியியல் நிறுவனங்களும் பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபாரங்கள் மற்றும் தொழில்களும் தமது வாடிக்கையாளர்களுக்கான கொடுக்கல்வாங்கல்களை மேற்கொள்ளும் போது, வாடிக்கையாளர் அல்லது பயன்பெறு சொந்தக்காரர் அரசியல்ரீதியாக முகங்கொடுக்கும் ஆளொருவரா என்பதனை நிர்ணயிப்பதற்கு, உள்ளகக் கொள்கைகளை, நடைமுறைகளை மற்றும் கட்டுப்பாடுகளை நடைமுறைப்படுத்துமாறு அவை வேண்டப்பட்டுள்ளன.

இது, 2006ஆம் ஆண்டின் 06ஆம் இலக்க நிதியியல் கொடுக்கல்வாங்கல்கள் அறிக்கையிடல் சட்டம், 2016ஆம் ஆண்டின் 01ஆம் இலக்க நிதியியல் நிறுவனங்கள் (வாடிக்கையாளர் உரிய விழிப்புக்கவனம்) விதிகள், 2018 ஆம் ஆண்டின் 01ஆம் இலக்க பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபார (வாடிக்கையாளர் உரிய விழிப்புக்கவனம்) விதிகள் என்பவற்றின் கீழான தேவைப்படுத்தலொன்றாகும்.

வாடிக்கையாளர்களிடமிருந்து அத்தகைய தகவல்களை சேகரித்தல் உலகளவில் ஏற்றுக்கொள்ளப்பட்ட நடைமுறையொன்றாகும், ஆகையினால், அனைத்து நிதியியல் நிறுவனங்களினதும் பெயர்குறிக்கப்பட்ட நிதியல்லா வியாபாரங்கள் மற்றும்

அரசியல்ரீதியாக முகங்கொடுக்கின்ற ஆட்கள் தொடர்பான மேலதிக தகவல்களுக்காக, நிதியியல் உளவறிதல் பிரிவு மூலம் வெளியிடப்பட்ட "2019ஆம் ஆண்டின் 03ஆம் இலக்க அரசியல்ரீதியாக முகங்கொடுக்கின்ற ஆட்களை அடையாளங்காணுதல் மீதான வழிகாட்டல்" இனைப் பார்ப்பதற்கு QR குறியீட்டை ஸ்கேன் செய்யவும்.

உங்களுக்கு மேலதிக தெளிவுபடுத்தல்கள் தேவைப்படுமாயின், தயவுசெய்து நிதியியல் உளவறிதல் பிரிவைத் தொடர்புகொள்ளவும்.

මූල්‍ය බුද්ධි ඒකකය

நிதியியல் உளவறிதல் பிரிவு

FINANCIAL INTELLIGENCE UNIT

☎ 0112 477 125 | 0112 477 692 | fiu@cbsl.lk | www.fiusrilanka.gov.lk